# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

### 4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

සමාජ විද්‍යාව
**Social Science**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I වන කොටසේ ප්‍රශ්න සියල්ලටත් , II වන කොටසින් ප්‍රශ්න හතරකටත් පිළිතුරු ලියන්න.**

## I කොටස

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. 'සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි.' යන නිර්වචනය කාගේ ද?
ii. ප්‍රංශ විප්ලවය ඇති වූයේ කිනම් වර්ෂයක ද?
iii. සමාජ පරිණාමය පිළිබඳ ඉගැන්වූ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.
iv. හර්බට් ස්පෙන්සර් දැක්වූ පරිණාමයේ අවධි දෙක නම් කරන්න.
v. සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
vi. ගොවිතැන් කටයුතු කිරීමේ දී කන්න තුනක් වැඩ කළ බව සඳහන් සෙල්ලිපිය කුමක් ද?
vii. මව් කුසේ දී දරුවා කළලයේ සිට මවගෙන් කායිකව හා මානසිකව පෝෂණය ලබන බව පැවසෙන සූත්‍රය කුමක් ද?
viii. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට HIV ( ඒඩ්ස්) වෛරසය ශරීරගත වූ ආසාදිතයා සොයා ගත්තේ කිනම් වර්ෂයක ද?
ix. බටහිර මනෝ විද්‍යාවේ පියා කවු ද?
x. මානවයාගේ ආරම්භයේ සිට සමාජ පාලනයක් පිළිබඳ කියවෙන සූත්‍රය කුමක් ද?

(ලකුණු 4 × 10 = 40 )

## II කොටස

02. i. සමාජ විද්‍යාව යනු කුමක් දැයි නිර්වචනයකින් දක්වන්න.
ii. සමාජ විද්‍යාවේ උප විෂයන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
( ලකුණු 7 + 8 = 15 )

03. i. ප්‍රාථමික සමාජයක ඇති ලක්ෂණ හතරක් නම් කරන්න.
ii. සමාජ පරිණාමය කෙරෙහි බලපාන සාධක මොනවා දැයි කෙටියෙන් පහදන්න.
( ලකුණු 7 + 8 = 15 )

04. i. සංස්කෘතිය යනු කුමක් ද?
ii. සමාජය පවත්වා ගැනීමේ දී සංස්කෘතිය කෙතරම් දුරට බලපාන්නේ දැයි සරලව දක්වන්න.
( ලකුණු 7 + 8 = 15 )

05. i. ශ්‍රී ලංකාවේ භාවිත භාෂා ත්‍රිත්වය නම් කරන්න.
ii. මහින්දාගමනය රාජ්‍ය පාලනයට බෙහෙවින් බලපා ඇත. සැකෙවින් කරුණු ඉදිරිපත් කරන්න.
( ලකුණු 7 + 8 = 15 )

06. i. ජනගහනය වැඩිවීමෙන් නගර ආශ්‍රිතව ඇති වන ගැටලු නිර්මාණයට බලපාන සාධක තුන ලියන්න.
ii. සමාජ පාලනයට අධ්‍යාපනයේ ඇති වැදගත්කම කෙටියෙන් හඳුන්වන්න.
( ලකුණු 7 + 8 = 15 )

07. i. සමාජ ප්‍රශ්න හතරක් නම් කරන්න.
ii. ශ්‍රී ලංකාව තුළ සියදිවි නසා ගැනීමට බලපාන සාධක පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
( ලකුණු 7 + 8 = 15 )